විලම් ඩි වින්ක්

# යේසුස් වහන්සේ මෙසියස් වහන්සේ

## ලෝකය වෙනස් කළ තැනැන්වහන්සේ




මිලියන 2
චිත්‍ර කථා පොත්

භාෂා 200 කට වඩා
මුද්‍රණය කර ඇත

විලෙම් ඩ් වින්ක්

# යේසුස් වහන්සේ මෙසිස්වහන්සේ

## ලෝකය වෙනස් කළ තැනැන්වහන්සේ



## යේසුස් වහන්සේගේ කාලය

යේසුස් වහන්සේගේ උත්පත්තියත් සමඟ අපගේ යුගය ආරම්භ විය. මුල් කාලයේ මිනිසා ගමන් ගත්තේ පාගමනින්, බූරුවකු පිට, හෝ අශ්වයින් භාවිතා කරමිනි. රෝම අධිරාජ්‍යය යටතේ, යුරෝපයේ ප්‍රධාන රටවල් මැදපෙරදිග, සහ දකුණු අප්‍රිකාව පාලනය විය. එකල බොහෝ දෙනෙක් කියවීමට හෝ ලිවීමට සමර්ථ වූයේ නැත. බයිබලය තුළින් දෙවියන් වහන්සේ කථා කළ සේක. අලංකාර ලෝකයේ මැවුම්කරුවාණන් දෙවියන් වහන්සේ වූ සේක. උන්වහන්සේට සියලු මිනිසුන් සමඟ මිතුරු වීමට අවශ්‍ය විය. යේසුස් වහන්සේ එය ඉතා පැහැදිලි ලෙස පෙන්වා දුන් සේක.

## මෙසියස් වහන්සේ වූ යේසුස් වහන්සේ යනු කවුරුන්ද ?

අවුරුදු 2000 පෙර යේසුස් වහන්සේ ඉශ්‍රායෙල් රටේ ජීවත් වූසේක. අප උන්වහන්සේව හඳුන්වනු ලැබූයේ යේසුස් වහන්සේ, මෙසියස් වහන්සේ නැතහොත් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ලෙසිනි. එයින් අර්ථවත් වූයේ එතුමා රජු ලෙසිනි. එතුමා රජු ලෙස පමණක් නොවේ. දෙවියන් වහන්සේගේ පුත්‍රයා ලෙසත්, මනුෂ්‍ය පුත්‍රයා ලෙසත් හඳුන්වනු ලැබුවේය. උන්වහන්සේ , දෙවියන්වහන්සේගේ පුත්‍රයා ලෙසත්, මිනිසෙකු ලෙසත්, එයින් අර්ථවත් විය. බයිබලය තුළින් උන්වහන්සේගේ ඓතිහාසික ජීවිත කථාව එළිදක්වයි. එය සියලු යුගයන්වලටම අයිති බලවත් කථා පුවතකි.

## ජේසුස් වහන්සේගේ උත්පත්තිය


යේසුස් වහන්සේගේ මව වූ මරියතුමිය, විවාහ වීමට පෙර ගර්භනී වූවාය. උන්වහන්සේගේ උත්පත්තිය සිදුවන තුරු ඇය කන්‍යාවක් ලෙස සිටියදීම මවක් වීමට දෙවියන් වහන්සේ සැලැස්වූ සේක. නමුත් යේසුස් වහන්සේ වීරයෙකු ලෙස හෝ වෙනත් විශේෂ කෙනෙක් ලෙස උපත නොලැබ, ගව මඩුවක ඉතා දිලිඳු ලෙස උපත ලැබූ සේක.



## මොනවාද ?

**දේවදූතයා :-** නොපෙනෙන, දෙවියන් වහන්සේගේ පණිවිඩකරු (පි5)

**බයිබලය :-** බයිබලය තුළින් දෙවියන්වහන්සේ මිනිසාව දකින ආකාරය හා ගනුදෙනු කරන ආකාරය දැනගත හැකිවේ.



**ආශිර්වාදය :-** දෙවියන් වහන්සේ කැමැති ඉතා යහපත් දේ කරන අයට උන්වහන්සේ ලබා දෙන අනුග්‍රහය.

**ශුද්ධ සහභාගිකම :-** යේසුස් වහන්සේගේ අනුගාමිකයින් විසින් උන්වහන්සේගේ මරණය හා උත්ථානය සිහි කරමින් මිදියුෂ හා රොටී ලබා ගැනීම.




**කුරුසිය :-** යේසුස් වහන්සේ සිය කැමැත්තෙන්ම වරදකරුවන් උදෙසා පිළයෙල කළ කුරුසියේදී තම ජීවිතය පූජා කළ සේක. එය පසුකාලයේදී යේසුස් වහන්සේගේ අනුගාමිකයන්ගේ සලකුණ බවට පත්විය. (පි 25, 50)



**අනුගාමිකයින් :-** යේසුස් වහන්සේ අනුගමනය කරන අය (පි.18)

**පාස්කුව :-** යේසුස් වහන්සේගේ නැවත නැගිටීම සැමරීම එදිනම යුදෙව්වන් ද ඔවුන්ගේ පාස්කුව සමරයි. (පි. 38-54)



**සදාකාලික ජීවනය :-** දේව අනුග්‍රහයෙන් යේසුස් වහන්සේගේ කුල ජීවනයයි. එනම් මරණයෙන් පසු ලබන්නා වූ සදාකාල ජීවනයයි. එහි කෙළවරක් නැත.

**ඇදහිල්ල :-** දේව පොරොන්දුව ඉටුවීම පිළිබඳ ඔබ තුළ පවතින විශ්වාසයි.



**සමාව ලැබීම :-** අප කිසිවෙකු ලැබීමට සුදුසු නැති දේව සමාව ලැබීම. සැබවින්ම ඔබ පාපයට පසුතැවිලි වී වෙනස්වීමට කැමති වූ විට දේව සමාව ලබාගත හැකි වේ. මක්නිසාද ඔබගේ හා මගේ පාපයේ වන්දිය යේසුස්වහන්සේ කුරුසියේ දී දරා ගත් සේක.

**දේව රාජ්‍යය :-** මිනිසුන් දෙවියන් වහන්සේට කීකරුවන තැන දේව රාජ්‍යයයි.

**ශුද්ධාත්මයාණන් :-** යේසුස් වහන්සේ විශ්වාස කරන මිනිසුන්ගේ හදවත්වල ශුද්ධාත්මයාණන් වහන්සේ එනම් දේව ආත්මය වාසය කරන සේක. (පි 58)

**යේසුස් වහන්සේ :-** දෙවියන්වහන්සේගේ පුත්‍රයාගේ නමයි. එහි අර්ථය 'දෙවියන්වහන්සේ ගළවයි'

**මෙසිස්යස් වහන්සේ :-** 'ආලේපලත් රජු ' මෙසායා යනු හෙබ්‍රෙව් නාමයයි. " ක්‍රිස්තුස් " යනු ග්‍රීක පරිවර්ථනයයි. (පි. 52,55)

යාච්ඤාව :-දෙවියන් වහන්සේ සමඟ සංවාදයේ යෙදීම. නිශ්ශබ්දව හෝ ශබ්ද නඟා සංවාදයේ යෙදීම හා ඇහුන්කන් දීම එහි අර්ථය වේ. (පි.18,19,42)

**නැවත නැගිටීම :-** යේසුස් වහන්සේ මරණයෙන් උත්ථාන වීම එක දවසකදී යේසුස් වහන්සේ විශ්වාස කරන සෑම කෙනෙක්ම මරණයෙන් නැගිටීම සිදුවේ. එකළ දෙවියන් වහන්සේ සෑම මනුෂ්‍යයකුම විනිශ්චය කරන සේක. (පි. 53-57)


**නැවත පැමිණීම :-** නැවත මේ ලෝකයට යේසුස් වහන්සේ පැමිණෙන දවසේදී සියල්ලම අළුත් වේ. දෙවියන්වහන්සේ අහසත් පොළොවත් නැවත අළුත් කරන සේක. (පි. 57)

**සාතන් :-** දෙවියන් වහන්සේ හා මිනිසා අතර සිටින නොපෙනෙන විරුද්ධකාරයා (ඔහු සාතන් ලෙස හඳුන්වයි)

**පාපය:-** දෙවියන් වහන්සේගේ කැමැත්තට විරුද්ධව අප විසින් සිදුකරන සියළුම ක්‍රියාවන් හා උන්වහන්සේ අප ළඟා වෙතැයි අපේක්ෂා කළ සියලුම ඉලක්ක නොසලකා හැරීම පාපයයි.
(පි. 4)

**දෙවියන් වහන්සේගේ පුත්‍රයා :-** යේසුස් වහන්සේ නම් වූ දෙවියන් වහන්සේ දේවත්වය අත්හැර මනුෂ්‍යයෙකු ලෙස මේ ලෝකයට ආ දේව පුත්‍රයාය.

# යේසුස් වහන්සේගේ කාලයේ ඉශ්‍රායලය




**අගනුවර :-** යෙරුසලම

**පළාත් :-** ගලීලය, සමාරිය, යුදය

**විශාලත්වය :-** 28,000 $km^2$ පමණ (ව.සැ. 10810)

**දේශගුණය :-** අර්ධ නිවර්තන

**දේශපාලනය :-** ක්‍රි.පූ 63 පමණ සිට යේසුස් වහන්සේගේ උත්පත්තියට පෙර රෝම අධිරාජයා විසින් ඉශ්‍රායෙලය පාලනය කරන ලදී.

**ආණ්ඩු බලය :-** පොන්තියුස් පිලාත් රෝම පාලකයින් විසින් පත් කළ ආණ්ඩුකරුවෙකි. තිබේරියස් නම් වූ රෝම අධිරාජ්‍යයා විසින් ඔහු පාලනය කරන ලදී.

**ආගම :-** යුදා ආගම යෙරුසලමෙහි යුදෙව්වන්ට දේව මාලිගාවක් විය. යුදෙව්වරුන්ගේ ආගමික නායකයින් විසින් සියළුම ආගමානුකූල චාරිත්‍ර හා ඉගැන්වීම් සිදු කරනු ලැබීය. (පරිසිවරු) බයිබලයේ පරිසිවරු ලෙස හඳුන්වණු ලැබුයේ මෙම ආගමික නායකයින් ය.

**භාෂාවන් :-** හෙබ්‍රෙව් (යුදෙව්වරුන්ගේ භාෂාව) ග්‍රීක් (එකළ ජාත්‍යන්තර භාෂාව) ලතින් (රෝමවරුන්ගේ භාෂාව) භාවිතා කර ඇත.



## බයිබලය

යේසුස් වහන්සේ පිළිබඳ කථාව බයිබලයේ ලියැවී ඇත. බයිබලය තරම් කියවනු ලැබූ වෙනත් කිසිම පොතක් නැත. එය පොත් විශාල සංඛ්‍යාවක එකතුවකි. එය ලියා නිමවීමට අවුරුදු 1500 පමණ ගත වී ඇත. අවුරුදු 1900 පෙර එය ලියා අවසන් කරන ලදී. දෙවියන් වහන්සේ මනුෂයාගේ ජීවිතය උදෙසා මැදිහත් වූ අයුරු පිළිබඳ කතාන්දර රාශියක් එහි ඇතුළත් වී ඇත. යේසුස් වහන්සේගේ චරිතාප්‍රදානයෙන් දෙවියන් වහන්සේ යනු කවුදැයි මනාව ප්‍රකාශ වේ.

## යේසුස් වහන්සේගේ ඓතිහාසික කථාව

යේසුස් වහන්සේගේ ජීවිත කථාව අන්තර්ගත වූ පොත් 04 ක් බයිබලයට ඇතුළත් වී ඇත. පොත් නම් කර ඇත්තේ එම පොත් ලියනු ලැබූ පුද්ගලයින්ගේ නම් වලිනි. ඔවුන් යේසුස් වහන්සේගේ කාලයේ ජීවත් වූ සමකාලීන අයයි.

**1. මතෙව්** - ඔහු යේසුස් වහන්සේගේ අනුගාමිකයෙක් බදු එකතු කරන්නෙකි. යුදෙව්වන් සමඟ යේසුස් වහන්සේ ගනුදෙනු කළ ආකාරය ඔහු විශේෂයෙන් පැහැදිලි කරයි.

**2. මාර්ක්** - යේසුස් වහන්සේ, උන්වහන්සේගේ සේවය කරන කාලයේ මාර්ක් නව යොවුන් වියේ තරුණයෙකි. ඔහු යේසුස් වහන්සේ සිදු කළ හාස්කම් රචනා කරන ලදී.

**3. ලූක්** - ඔහු වෛද්‍යවරයෙකි. ඔහු පුද්ගලිකව යේසුස් වහන්සේව හඳුනාගෙන සිටියේ නැත. යේසුස් වහන්සේ මිනිසුන් සමඟ ක්‍රියාකල ආකාරය ලූක්තුමා විසින් රචනා කරන ලදී.

**4. යොහන්** - යේසුස් වහන්සේගේ අනුගාමිකයෙකි. යේසුස් වහන්සේ කවුරුන්ද යන්න පෞද්ගලිකව ඔහු විස්තර කරන ලදී. මනුෂ්‍යයා පාපයෙන් නිදහස් කරන පිණිස මනුකයන් දරාගත් යේසුස් වහන්සේ දෙවියන් වහන්සේමය.



## යේසුස් වහන්සේගේ මරණය සහ නැවත නැගිටීම.

**යේසුස් වහන්සේ මැරුණේ ඇයි ?**


**බයිබලයේ එය මනාව පැහැදිලි කර ඇත**


සෑම මනුෂ්‍යයෙක්ම සමහර අවස්ථාවල වැරදි කරනවා. දෙවියන් වහන්සේ අනුමත නොකරන,උන්වහන්සේව කෝප කරන හෝ දුක හිතෙන ක්‍රියාවන් පාපය ලෙස හඳුන්වනු ලැබේ. දෙවියන් වහන්සේ සමඟ මිතුරු වීමෙන් මේ සෑම වරදකින්ම වැළකී සිටීමට හැකි වේ. ඒ නිසාම යේසුස් වහන්සේ ස්වකීය කැමැත්තෙන් අපගේ පාපය උදෙසා දඬුවම විඳීමට ඉදිරිපත් වූ සේක. "මරණය" ඒ දඬුවමයි. යේසුස් වහන්සේ අප උදෙසා මරණයට පත් වූ සේක. නැවත දෙවියන් වහන්සේ සමඟ මිතුරුවීමට අපට හැකිය. නමුත් අප කළ වරද වලට සමාව ඉල්ලා ගැනීම අවශ්‍ය වේ. යේසුස් වහන්සේ මරණයෙන් උත්ථාන වූ සේක. දෙවියන් වහන්සේ යේසුස් වහන්සේට නැවත ජීවනය ලබා දුන් සේක. දෙවියන් වහන්සේ මරණයට වඩා බොහෝ බලවත් බව ඉන් පෙන්වා දුන් සේක. යේසුස් වහන්සේ නැවත දෙවියන් වහන්සේ සමඟ සිටින සේක. මක්නිසාද උන්වහන්සේ ජීවමානව සිටින බැවින් අප සමඟ නිතරම මිතුරු වී සිටීමට හැකි වී ඇත. දෙවියන් වහන්සේට ප්‍රසන්න වූ ජීවිතයක් ගත කිරීමට අපට උපකාර කිරීමට යේසුස් වහන්සේට අවශ්‍ය වූ සේක.


## යේසුස් වහන්සේ සිදු කළ හාස්කම්


යේසුස් වහන්සේ බොහෝ හාස්කම් සිදු කළ සේක. සුව කිරීම් 40 ට වඩා බයිබලයේ සඳහන් වේ. හාස්කම් වල අර්ථය වූයේ යේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ බලය හා ප්‍රේමය දැක්වීමයි. මනුෂ්‍යයන්ට උදව් කිරීමට හා ඔවුන්ගේ ප්‍රීතිය උදෙසා මැදිහත් වීමට දැන්වූ කැමැත්තයි.





මේ මිනිසුන් ගඟ ලඟ එකතු වී සිටින්නේ මක්නිසාද ?
ඔබගේ ජීවිතය පිළියෙල කරගන්න. මක්නිසාද, දෙවියන් වහන්සේ අළුත් දෙයක් කරන්න යන සේක.


ජීවිතය අළුතින් පටන් ගන්න.
දෙවියන්වහන්සේගෙන් ඔබට ගැලවීමට නොහැකියි. උන්වහන්සේ විනිශ්චය නැමැති පොරොව දැනටමත් ගසමුලට තබා තිබේ.
හොඳ ඵල නොදරන සියළුම ගස් කපා ගින්නට දමනු ලැබේ.
මේ අහන්න, අප හොඳ අය නොවේද ?
දෙවියන් වහන්සේගේ විනිශ්චයෙන් මිදීමට කිසිවෙකුටත් බැහැ. නමුත් මට පසුව එන තැනැත්තා, ඔබව, ඇතුලතින් හා පිටතින් වෙනස් කිරීමට සමර්ථයි.
ඔබට ජීවිතය වෙනස් කර ගැනීමට සැබැවින්ම අවශ්‍යයද ? එසේ නම් මෙහි ඇවිත් වතුර බෞතිස්මය ලබා ගන්න.
දැන් ඔබ, ඔබගේ පාපයෙන් නිදහස්. අළුත් ජීවිතයක් ආරම්භ කරන්න.


ගඟ ලඟ දේශනා කළ ඔහුව සියල්ලෝම හඳුන්වනු ලැබුයේ, යොහාන් බෞතිස්ත ලෙසයි.
ඒ මා ගැන නොවේ. එන්නාවූ තැනැන්වහන්සේ උදෙසා මා ඔබව සූදානම් කරනවා. දෙවියන්වහන්සේට අවශ්‍යය දේවල් ඔහු අපට පෙන්වා දෙයි. එතුමා ශුද්ධාත්ම ගින්නෙන් ඔබව බෞතිස්ම කරන සේක. එතුමා සම්පූර්ණයෙන්ම ඔබව වෙනස් කරන සේක.
එවිට
ඔබ විසින් මා, බෞතිස්ම කළ යුතුයි.
දැන් ම බෞතිස්ම කරන්න. එවිට, දෙවියන්වහ්සේ ගේ කැමැත්ත අප විසින් ඉටු කරනු ලබයි.
පියාණෙනි, ඔබගේ රාජ්‍යය ඒවා, ඔබගේ කැමැත්තද, ඉටු වේවා.
හදිසියේ ම, ස්වර්ගයෙන් හඬක් නිකුත් විය.
ඔව්, ඔබ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය. මම ඔබ ගැන ප්‍රසන්න වෙමි.


යොහාන් බෞතිස්ත, මෙසියස් වහන්සේගේ පැමිණීම
උදෙසා, ඉශ්‍රායෙල් ජාතිකයින් සූදානම් කළේය.
මේ අවධිය රෝම අධිරාජ්‍යය, ලෝකයේ විශාලම
අධිරාජ්‍යය විය. ඉශ්‍රායලය, රෝම අධිරාජ්‍ය යටතේ
තිබූ ඉතාම කුඩා රාජ්‍යය විය.
ඉශ්‍රායෙලය
කපර්නවුම
ගලීලය
නාසරෙත්
කානා
මධ්‍යධරණී මුහුද
යෝර්දානය
යෙරුසලම
යුදය
යුදෙව් ජාතිකයින්
මෙසියස් වහන්සේ
ගැන ඉතා ආශාවෙන්
බලා සිටියෝය. ඒ
පිළිබඳව ඔවුන්ගේ
ව්‍යවස්ථා පොතේ
ලියැවී තිබුණි.
එතුමාගේ පැමිණීම
ඉශ්‍රායලයට විශාල
බලාපොරොත්තුවක්
බව දිවැසිවරු විසින්
ප්‍රකාශ කර තිබුණි.
නමුත්, යොර්දාන් ගඟ ළඟදී, යේසුස් පූජාවෙන්නා වූ බැටළු පැටවා ලෙස
යොහාන් බෞතිස්ත විසින් ප්‍රකාශ කරන ලදී.
“බලන්න, ලෝකයේ
පාපය දුරු කරන
බැටළු පැටවාණෝ”
ශුද්ධාත්මයාණෝ,
යේසුස්වහන්සේව,
අසළ තිබූ
කාන්තාරයට
ගෙන ගියසේක.
දවල් හතළිහත්ද, රාත්‍රී හතළිහක්ද,
උන්වහන්සේ නිරාහාරව සිටිමින් යාච්ඤා
කළ සේක. උන්වහන්සේගේ සේවය
උදෙසා තමාවම සූදානම් කරගත් සේක.
යේසුස් වහන්සේ,
දෙවියන් වහන්සේගේ
සැලැස්ම ක්‍රියාත්මක කිරීමට
සූදානම් වූ සේක. මිනිසාව
මරණයේ හා බයාදුකමේ
ආත්මයෙන් නිදහස් කිරීමට
දෙවියන් වහන්සේට අවශ්‍ය වූ
සේක.
සාතන්, අන්ධකාරයේ පාලකයා,යේසුස් වහන්සේ වෙතට
පැමිණියේය. දෙවියන් වහන්සේට හා මිනිසාට සතුරු වූ
සාතන්, වෛරය, රෝගය සහ මරණය තුළින් මිනිසාව පාලනය
කළේය.
ඔව්,
පියාණනි,
මම ඔබට
අවශ්‍යය දේ
ඉටුකරමි.


නමුත් යක්ෂයා, යේසුස් වහන්සේ තුළ තිබූ දේව සැලැස්ම වෙනස් කිරීමට උත්සාහ ගත්තේය.
ඔබ දෙවියන්වහන්සේගේ පුත්‍රයා නම්, මේ ගල් රොටි වෙන්නට අණ කරන්න.
නැහැ, දේව වචනයේ එසේ ලියැවී නැහැ. මනුෂ්‍යයා රොටී පමණකින් ජීවත් නොවේ. දෙවියන් වහන්සේගේ මුඛයෙන් පිටවන වචනවලින් ජීවත් වෙයි.
ඔබ දෙවියන්වහන්සේගේ පුත්‍රයා නම් ඔප්පු කරන්න. දේව මාළිගාවේ මුදුනේ සිට පහළට පනින්න. ශුද්ධ ලියවිල්ලේ තිබෙන ආකාරයට, දෙවියන් වහන්සේ ඔබ ආරක්ෂා කරන පිණිස උන්වහන්සේගේ දූතයන් එවයි.
නැහැ එහි ඔබගේ දෙවියන් වහන්සේව පරීක්ෂා කිරීම සුදුසු නැතැයි ද, ලියා තිබේ.
බලන්න, මම පොළොවේ සියලු රාජ්‍ය බලය ඔබට දෙමි. නමුත් ප්‍රථමයෙන් ඔබ මා නමස්කාර කළ යුතුයි.
සාතන්, අහක්ව යව, මක්නිසාද තාගේ දෙවි වූ ස්වාමින් වහන්සේට පමණක් නමස්කාර කරව, උන්වහන්සේට පමණක් සේවය කරවයි. ලියා තිබේ.
ඉන්පසු යක්ෂයා ටික කලකට යේසුස් වහන්සේව අතහැර ගියේය. දේවදූතයෝ උන් වහන්සේට උපස්ථාන කළෝය.
යේසුස් වහන්සේ නැවත හැරී ගලීලයට ආසේක. දෙවියන්වහන්සේගේ ආත්මයෙන් පූර්ණව, යේසුස් වහන්සේ ගමන් කරන කළ මිනිසුන් උන්වහන්සේ සමඟ එකතු විය. උන්වහන්සේ මෙසියස් වහන්සේදැයි ඔවුන් තුළ සැකයක් ඇතිවිය.


ගලීලයේ කනාන්හි සරණ මංගල්‍යයක් විය.
යේසුස් වහන්සේ, උන්වහන්සේගේ මෑණියන්ද, මිතුරන්ද සමඟින් එහි ගිය සේක.


නුමුත් උත්සවය අතරතුරේදී,
මොන විපතක්ද ? මිදි යුෂ ඉවරයි.
යේසුස් වහන්සේ කියන දේ කරන්න.
මේ, විශාල භාජනවලට වතුර පුරවා උත්සවයේ ප්‍රධානියා ළඟට ගෙනියන්න.
?
වතුර ? නමුත් මේවා මිදියුෂ ඉතා අනර්ඝ මිදියුෂ
මෙහි රස බලන්න ! ඔබ අවසාන වන තුරු හොඳ මිදියුෂ තබා ගත්තා
පුදුම උත්සවයක්, පුදුම මංගල්‍යයක්, වතුර මිදි යුෂ වුනා. ඉතා රසවත් මිදියුෂ පානයක් වුනා.
නාසරෙත්හි යේසුස් මේක කළා
ඔහු කවුද ?


කපර්ණවුම, ගලීල මුහුද අසළ පිහිටි ඉතා සශ්‍රීක මසුන් අල්ලන්නාවූ ගම්මානයකි. මෙහි සිට යේසුස් වහන්සේ, දෙවියන් වහන්සේගේ සුභාරංචිය දේශනා කිරීම ආරම්භ කළ සේක.
මෙහි සිට උන්වහන්සේ ගේ ප්‍රථම ගෝලයන් තෝරා ගත් සේක.
පේත්‍රුස්, ගැඹුරු මුහුදට ගොස් ඔබගේ දැළ එහි දමන්න.
ස්වාමිනි, අපි මුළු රාත්‍රියේම මසුන් ඇල්ලීමට දැල් දැමූ නමුත් මසුන් අසුවුනේ නැහැ.
නමුත් ඔබ කියනවා නම්,
පුදුමයි, මට එය විශ්වාස කරන්නත් අමාරුයි.


යාකොබ්, යොහාන්, එන්න උදව් කරන්න. මේ තරම් මාලු ප්‍රමාණයක් අහුවුණ මගේ ජීවිතේ පළවෙනි වතාව.
ස්වාමිනි, මා අත්හැර යන්න. මම පව්කාර මනුෂ්‍යයෙකි.
පේත්‍රුස්, භයවන්න එපා, මෙතැන් සිට ඔබ මසුන් අල්ලන්නෙක් නොව මනුෂ්‍යයන් අල්ලන්නෙක් කරමි.
මා අනුව එන්න,


යේසුස් වහන්සේ, උන්වහන්සේගේ ගෝලයන් සමඟ උතුරු ඉශ්‍රායලයට ගමන් කළ සේක. “දෙවියන් වහන්සේගේ රාජ්‍යය ලංව තිබේ.” යැයි උන්වහන්සේ ප්‍රකාශ කළ සේක. උන්වහන්සේගේ වචන බලයෙන් සහ කරුණාවෙන් යුතු විය. යේසුස් වහන්සේ රෝගීන් සුව කරමින්, පාපයෙන් සහ යක්ෂයාගේ බලයෙන් මිනිසුන්ව නිදහස් කළ සේක. බොහෝ දෙනෙක් උන්වහන්සේව අනුගමනය කළෝය. ඔවුහු වෙනත් ප්‍රදේශවලින්ද, යෙරුසලමෙන්ද, එනම් ඉශ්‍රායෙලයේ ප්‍රධාන නගරයෙන්ද, පැමිණ සිටියහ.















මනුෂ්‍යයන් විසින් යමක් ඔබට කරනවාට කැමතිද, ඒ දේ ඔබත් ඔවුන්ට කරන්න.
ඔබගේ සතුරන්ට ප්‍රේම කරන්න. ඔවුන් උදෙසා යාච්ඤා කරන්න.
කිසිවෙකුට නොදැනෙන්න ඔබ කරන යහපත රහසින් කරන්න.
ස්ත්‍රියක් දෙස රාගයෙන් බලන කවරෙක් නමුත් ඒ වේලෙහිම ඇය සමඟ, ඔහුගේ සිතින් කාමමිථ්‍යාචාරය කරන්නේය.
ඇස ශරීරයේ පහනයි. ඇස පැහැදිලි නම් ඔබේ මුළු ශරීරයම එළිය වන්නේය. ඔබේ ඇස අඳුරු නම්, ඔබ අඳුරේ ජීවත් වෙයි.
ස්වාමිවරු දෙදෙනෙකුට සේවය කිරීමට කිසිවෙකුට නොහැකිය. එනම් දෙවියන් වහන්සේට හෝ වස්තුවට සේවය කිරීම.
හෙට දවස ගැන කණගාටු නොවන්න. පළමුව දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයන්න. එවිට අන් සියල්ල ලැබේ.
මා කී ලෙස කරන්න. එවිට ඔබ පර්වතය මත ගෙයක් ගොඩනඟන කෙනෙකු හා සමානයි. ඔබ එසේ නොවේ නම් වැලිමත ගෙයක් සාදන්නෙකු හා සමානයි.


යේසුස් වහන්සේ කපර්ණවුමෙහි නිවසක සිටින විට මහත් සෙනඟක් එහි සහ අවට රැස්විය.
අපිට එහි ඇතුලට යන්න බැරිවෙයි.
වහලය ගලවා ඇඳ ඇතුලට ඇතුල් කරමු
වහළය උඩ සිදුවන්නේ කුමක්ද ?
ඔවුන්ට ඉඩ හරින්න. ඔවුන්ගේ ඇදහිල්ල ඉතා බලවත්.
ඔබගේ වරද සහ පාපය කමා කළා
කිව් දේ ඇහුනද ? ඔහු එසේ කීම වැරදියි.
ඔහු දෙවියන්වහන්සේට අපහාස කරනවා.
පාපය කමා කළ හැක්කේ දෙවියන් වහන්සේට පමණයි.
කියන්න වඩා පහසු දෙය කුමක් ද ? ඔබගේ පාපය කමා කළා කියන එකද ? නැඟිට ඇවිදින්න කියන එකද ?
කෙනෙක්ගේ පාපය කමා කළ හැක්කේ මෙසියස් වහන්සේට පමණයි. නමුත් මම කියනවා, ඔබගේ ඇඳ රැගෙන යන ලෙසට.



ඉතා විශ්මතයි
අංශභාග රෝගියා ඇවිදිනවා.
ඔව් මට සනීපයි. යේසුස් වහන්සේට ස්තුතියි.
යේසුස් වහන්සේ ඉතා යහපත් දේ සිදු කළ සේක. උන්වහන්සේ බලයෙන් හා ප්‍රඥාවෙන් කථා කළ සේක. උන්වහන්සේ සියල්ල කළේ ප්‍රේමයෙන් හා කරුණාවෙනි. නමුත් සියලු දෙනාම උන්වහන්සේ ගැන ප්‍රීති වූයේ නැත. නායකයින්ට ව්‍යවස්ථාව රැක ගැනීමට අවශ්‍ය විය. ඔවුන් යේසුස් වහන්සේ නීති, රීති කඩන තුරු බලා සිටියෝය. එනම් සබත් දවස වැනි ඒවා, සබත් දවස සතියේ පළිවෙනි දවසයි. එදිනට කිසිවක් කිරීම මුළු මනින්ම තහනම්ව තිබුණි.
වියැලුණු අතක් ඇති මනුෂ්‍යයෙකු මෙහි සිටිනවා. ඔහුව සුව කිරීම මේ දවසේදී යහපත්ද ? නැද්ද ?
ඔබේ අත දිගු කරන්න.
හුරේ. මගේ අත සුවවුනා
අපි එකට එකතුවෙලා යේසුස්ගෙන් නිදහස් වෙමු.
යෙරුසලමේ නායකයින් යේසුස් වහන්සේ , මිනිසුන්ව මංමුලා කරණ බව ප්‍රකාශ කළ යුතුයි.



යේසුස් වහන්සේ සහ යුදෙව් ආගමික නායකයින් අතර නුරුස්සන ගතියක් ගොඩනැඟුණි. යේසුස් වහන්සේ ඔවුන් අතරින් ඉවත් වූ සේක. ගෝලයින් සමඟ ඔරුවක නැඟ විලෙන් එගොඩට යෑමට පිටත් වූ සේක.
ස්වාමිනී, උදව් කරන්න. අපි ජලයේ ගිලෙමින් සිටිනවා.
ඔබ බයවෙන්නේ ඇයි ? ඔබගේ අදහිල්ල කොහේද ?



නිශ්චල වන්න
ගංගාවේ අනික් පැත්තට ගොස් ඔරුව ගං ඉවුරේ ගැටගැසුවෝය. ඒ අසල තිබූ කන්දේ අනෙක් පැත්තෙන් අමුතු ශබ්දයක් ඇසුණේය.
රෝ ආ..........ආ.............. ආ..... ආ.......... ආ......


හුදකලා වූ මිනිසෙක් එහි වාසය කළේය. ඔහු යක්ෂයා ආවේශ වූ අයෙකි.
ඔහු පැමිණෙනවා උ හ් හ්
හොඳයි, හොඳයි යේසුස්
අශුද්ධ ආත්මය මොහුගෙන් ඉවත්වන්න
මහෝත්තම දෙවියන්වහන්සේගේ පුත්‍ර වූ යේසුස් වහන්ස, ඔබට මගෙන් ඇති වැඩය කුමක් ද ?
ඔබගේ නම කුමක් ද ?
ලෙගියොන්, මක්නිසාද අප බොහෝ දෙනෙකි.
අතන ඉන්න ඌරු රංචුවට වැහෙන්න ඉඩ දෙන්න.
යන්න.


?
මම සම්පූර්ණයෙන්ම සුවයි.
යන්න අපිව අත්හැරලා
මම ඔබ සමඟ එන්නද ?
එපා ඔබ මෙහි ඉන්න දෙවියන් වහන්සේ ඔබට කළ දේ අන් අයට කියන්න.


මාගේ පියාණන් වහන්සේට අවශ්‍ය දේ පමණක් මා කරණ බව ඔබ දැනගත යුතුයි. පියාණන් වහන්සේ විසින් මා එවූ සේක.
යේසුස් වහන්සේ නිතරම නිහඬ ස්ථානයකට ගොස් යාච්ඤා කළ සේක.
එදින මුළු රාත්‍රියේම යාච්ඤා කර යේසුස් වහන්සේ, තමන්ගේ ගෝලයන් තෝරාගත් සේක. දෙදෙනා බැගින් ඔවුන්ව සේවය සඳහා පිටත් කර යැවූසේක. ඔවුන්ට රෝගීන් සුව කිරීමට හා යක්ෂ ආත්ම දුරු කිරීමට අවශ්‍යය අධිකාරි බලය ලබා දුන් සේක.
පේත්‍රුස් සහ ඇන්ද්‍රූ සහෝදරයෝය.
යාකොබ් සහ යොහාන්
පිලිප් සහ නතානියෙල්



තෝමස් සහ මතෙව් (රෝම පාලකයින් උදෙසා බදු මුදල් එකතු කරන්නන්)
තද්දියස් සහ ඔහුගේ සහෝදර වූ යාකොබ්
සීමොන් සහ යුදස් ඉස්කාරියොත්
යන්න, ඔබලා පිළිගන්නා මා පිළිගනී. මා පිළිගන්නා මා එවූ තැනැන්වහන්සේ පිළිගනී.
ගෝලයෝ දොළොස් දෙනා සේවය නිම කර ප්‍රීතියෙන් ආපසු පැමිණියෝය. යේසුස් වහන්සේ ඔවුන්ට කී සියල්ලම ඉටු කළෝය. ඔවුන් ආපසු පැමිණි විට යේසුස් වහන්සේට නිශ්චල තැනකට යාමට අවශ්‍යය වුවත් සෙනඟ යේසුස් වහන්සේට හුදකලාව සිටීමට ඉඩ නොදී..........
බලන්න, විශාල අස්වැන්නක්, නමුත් සේවකයින් ස්වල්ප දෙනෙක්ය. ගොයම කැපීම සඳහා සේවකයින් එවන ලෙස ගොයමේ ස්වාමියාට යාච්ඤා කරන්න.



යේසුස් වහන්සේ දේශනා කරමින්, රෝගීන් සුව කරමින් සිටියදී කාලය ගෙවී ගොස් ප්‍රමාද විය.
පිලිප්, මේ සියළු දෙනාටම කෑම සපයා ගන්නේ කෙසේද ? ඔබ ඔවුන්ට කිසිවක් නොදෙන්නේ ඇයි ?
අපි ළඟ ඇත්තේ මසු දෙසියක් පමණයි. එය ප්‍රමාණවත් නොවේ.
රොටි පහක් සහ මසුන් දෙදෙනෙක් ඇති දරුවෙක් මෙහි සිටිනවා. එපමණයි මෙහි ඇත්තේ.
එක පේළියකට පනහ බැගින් මිනිසුන් වාඩි කරවන්න.
යේසුස් වහන්සේ දෙවියන් වහන්සේට ස්තුති කොට.....
ඉන් පසු රොටි පහක් මසුන් දෙදෙනාත් ගෙන කඩා


යේසුස් වහන්සේ ආශිර්වාද කර වැඩිකර දුන් ආහාර දහස් ගනන් සෙනග කැවෝය.
අපට පොරොන්දු වුනාවූ මෙසියස් වහන්සේ එතුමා නේද ?
අපි එතුමා ව රජු ලෙස පත් කරගනිමු.
බලන්න, ඉතිරි වූ කෑම, කුඩ දොළහක් තියෙනවා.
මිනිසුන් ගෙවල්වලට යවන්න වෙලාව හරි. ඔරුව අරගෙන අනෙක් පැත්තට යන්න. මම මෙහි කන්දේ, යච්ඤා කරනු පිණිස නතර වෙනවා.


ඒ රාත්‍රියේ
ආ ආ ආ හා ඒ අවතාරයක්
භය වෙන්න එපා මේ මම
ස්වාමිනි, ඒ ඔබ නම්, ඔබ වෙතට එන්න. මට ඉඩ හරින්න.
එන්න
ස්වාමිනී, මාව ගලවා ගන්න.
පේත්‍රුස් ඔබ සැක කලේ ඇයි ?


සමහරුන්ට යේසුස් වහන්සේව රජු ලෙස පත් කර ගැනීමට අවශ්‍ය විය. උන්වහන්සේ , ඔවුන්ව රෝම පාලකයන්ගෙන් ගලවා ගනීවි යැයි බලාපොරොත්තු විය. යේසුස් වහන්සේ අනුගමනය කරන සෙනඟ වැඩිවිය. යේසුස් වහන්සේ, මිනිසුන්ට බොහෝ සේ උදව් කළ සේක. ආගමික නායකයින්, උන්වහන්සේ නීතියට විරුද්ධ වූ කැරළි කාරයෙකු ලෙස සිතුවෝය. උන්වහන්සේට විරුද්ධව මිනිසුන් පොළඹවා, යේසුස් වහන්සේව එලවා දැමීමට අවශ්‍ය විය.
ස්වාමිනි ඔබ මෙහි ආවේ කොයි වේලාවේද?
ඔබලා මා සොයන්නේ මා දුන් රොටි නිසාද?
නැති වී යන කෑම ගැන කරදර වන්න එපා. නමුත් සදාකාල ජීවනය ලබා දිය හැකි කෑම ගැන ආශාවන්න.
ජීවනදායක කෑම නම් මම ය. ලෝකයාට ජීවනය පිණිස දෙන්නා වූ කෑම නම් මාගේ මාංශයයි.
කොහොමද ඔහුගේ ශරීරය අපට කෑමට දෙන්නේ,
මෝඩ කථා
පැත්තකට යන්න
ඔහු හැමෝම රවටනවා
ඔවුන් වාගේ මා අතහැරලා නොයන්නේ ඇයි ?
ස්වාමීනි ඔබ අත හැරලා අප යන්නේ කා ළඟටද ? සදාකාල ජීවනයේ වචනය ඇත්තේ ඔබ ළඟයි.


මිනිසුන් යේසුස් වහන්සේට තර්ජනය කළෝය තවත් අයට උන්වහන්සේට ගල් ගැසීමට අවශ්‍ය විය.
ගලීලය
ඉශ්‍රායෙලය
යෙරුසලම
පසුව උන්වහන්සේ යෙරුසලම දෙසට ගමන් කළ සේක.
ගමන් මාර්ගයේදී,
මනුෂ්‍යයන් කියන්නේ මා කවුරුවන් කියාද?
ඔබ ප්‍රොපේතවරයෙකු බවයි. ඔවුන් හිතන්නේ,
ඔබ
මම කවුරු කියලද ඔබ කියන්නේ ?
ඔබ මෙසිස්වන්වහන්සේ, ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයා
කිසිවෙකුට එය කියන්න එපා. මෙසියස් වහන්සේ යෙරුසලමට ගොස් දුක්විද මරණයට පත්විය යුතුයි. නමුත් තුන්වෙනි දවසේ දී නැවත මරණයෙන් නැගිටුවනු ලබයි.



ඒ මාර්ගය දිගේ කුරුසපත් කර මිය ගිය මිනිසුන් විය. ඉතා නපුරු රෝම සොල්දාදුවෝ සමූහයක්ද එහි වූවෝය.
මා අනුව එන්න කැමති අය තමාගේ කුරුසිය රැගෙන මා පසු පස එන්න.
මක්නිසාද තමාගේ ජීවිතය ගලවා ගැනීමට කැමති කවරෙකුට නමුත් එය නැතිවන්නේ ය. මා නිසාද, ශුභාරංචිය නිසාද තමාගේ ජීවිතය නැති කරගන්න කවරෙක් නමුත් එය ගලවා ගන්නේය.
සිටින්නේ එකම දෙවි කෙනෙකු පමණක් බව ඔබ දැනගත යුතුයි.
වැදගත්ම දෙය වන්නේ, ඔබේ මුළු හදවතින්ම දෙවියන්වහන්සේට ප්‍රේම කිරීමයි. එවිට අන් සියල්ලත් ඔබට දෙනු ලැබේ.


ඉශ්‍රායෙල්හි, ව්‍යවස්ථාවට අනුව කුෂ්ඨ රෝගීන් අපවිත්‍ර අය ලෙස සලකන ලදී. ඔවුන් වෙනමම ජීවත් විය යුතුවිය. කිසිවෙකු විසින් ඔවුන් ඇල්ලීමටද එනම් අත ගැසීමටද තහනම් විය.
මෙම රෝගීන් පැමිණෙන විට ඔවුන් අපවිත්‍ර වූ අය බව දැනුම් දෙමින් පැමිණිය යුතු විය.
අපවිත්‍රයි !
අපවිත්‍රයි !
යේසුස් වහන්ස, ආචාරීන් වහන්ස, අපට කරුණා කළ මැනව.


යන්න, පූජකයන්ට පෙනී සිටින්න.
පූජකවරු ළගට යන්න ? අපව පරීක්ෂා කර බලන්න ?
එතකොට අපි සුවය ලබලද ?
?
!
ඔව් හැමෝම !
අපිට සුවය ලැබිලා!!!
එන්න
හාලේලූයියා ! දෙවියන් වහන්සේ යහපත් ! ඔබතුමාට ස්තුතියි !
ඔබ දසදෙනාම සුවයලැබුවා නොවේද? අනිත් නමදෙනා කොහේද? දෙවියන් වහන්සේට ගෞරව කරන්න ආවේ, ඔබ පමණක්ද ?
නැගිටින්න ඔබේ ඇදහිල්ල ඔබ සුවකළා පමණක් නොව ඔබව ගලවනු ලැබුවා.


යෙරුසලමේ සිටි ආගමික නායකයෝ, යේසුස් වහන්සේ හසුකර ගැනීමට මිනිසුන්ව උන්වහන්සේ ළඟට යැව්වෝය. උන්වහන්සේගේ වරදක් සොයා, අත්අඩංගුවට ගැනීම ඔවුන්ගේ බලාපොරොත්තුව විය.
යේසුස් වහන්සේ, රෝම නිළධාරීන්ට බදු මුදල් එකතු කර දෙන අය සමඟ සහභාගිකම් පැවැත්වූ සේක.
මෙසියස් වහන්සේ පැමිණියේ නැතිවූවන් සොයන පිණිසයි.
සබත් දවසේදී, යේසුස් වහන්සේ රෝගීන් සුවකළ සේක. නමුත් සබත කිසිවෙකු වැඩ නොකරන දවසකි.
සුවය ලබන්න
දරුවන් ගැන යේසුස් වහන්සේ විශේෂ අවධානයක් යොමු කළ සේක.
දරුවන් මා වෙතට එන්න ඉඩ හරින්න. මක්නිසාද, ස්වර්ග රාජ්‍යය මෙබඳු වූවන්ගේ ය.


යේසුස් වහන්සේ, යෙරුසලමට ලංවූ බෙතානියට ගිය සේක. එහි ලාසරුස් අසනීපව සිටියෝය. ඔහු සහ ඔහුගේ සහෝදරියන් වූ මර්තා සහ මරියා යේසුස් වහන්සේගේ මිතුරන් විය. යේසුස් වහන්සේ ඒ ගම්මානයට ගිය විය, ලාසරුස් මියගොස් දින හතරක් වූ බව දැනගැනීමට ලැබුණි.
ස්වාමිනි,
ඔබ වහන්සේ මෙහි සිටියානම් මගේ සහෝදරයා මිය යන්නේ නැහැ.
මර්තා, ඔබගේ සහෝදරයා නැවත අවදිවෙයි.
ඔව්, මම දන්නවා. මළවුන් නැවත නැගිටින දවසේදී ඔහු නැවත නැගිටියි.
මම, නැවත නැගිටීමත් ජීවනයත් වෙමි. මා විශ්වාස කරන්නා ජීවත් වෙයි. මර්තා ඔබ එය විශ්වාස කරනවා ද ?
ඔව් ස්වාමීනි, මම විශ්වාස කරනවා, ඔබ පැමිණෙන්නට සිටි මෙසියස් වහන්සේ බවත්, දෙවියන් වහන්සේගේ පුත්‍රයා බවත්
ඔහුගේ සිරුර තැම්පත් කළේ කොතනද ?
ස්වාමීනි, එන්න, බලන්න


බලන්න, උන්වහන්සේ ඔහුට කොතරම් ප්‍රේම කළාද ?
නමුත් උන්වහන්සේට ඔහුගේ මරණය වළක්වන්න බැරිවුණානේ,
ඔහුගේ මළ සිරුර, රෙදි වලින් ඔතනු ලැබ, ගල් ගුහාවක තැන්පත් කර තිබුණි.
ගල අහක් කරන්න.
ස්වාමීනි, ඔහු මියගොස් සතර දවසක්,
ඔබ දෙවියන් වහන්සේගේ මහිමය දකිනු ඇත
පියාණනි, මා මෙසේ කරන්නේ ඔබ, මා එව් බව ඔවුන් විශ්වාස කරන පිණිසයි.
ලාසරුස්, පිටතට එන්න,
ඔහුව මුදා යන්නට හරින්න.



යේසුස් වහන්සේ සහ උන්වහන්සේගේ ගෝලයෝ ගැන යෙරුසලමේ බලධාරීන් ඉතා විමසිලිමත් වීමට පටන් ගත්තෝය.
ඔහු බොහෝ හාස්කම් සිදුකරනවා
දිගටම එසේ කිරීමට ඉඩ හැරියොත් රෝමවරු ඔහුට විරුද්ධ වී ක්‍රියා කරයි.
ඔවුන් අපේ ජාතිය හා දේව මාලිගාව විනාශ කරයි.
ටිකක් හිතන්න ජාතිය හා අප සියළුදෙනා විනාශ වනවාට වඩා එක් මනුෂ්‍යයකු මිය යන එක හොඳයි.
ඒක නිසා යේසුස් මැරෙන එක හොඳයි
සියළු දෙනා උදෙසා එක මිනිසෙකු මිය යා යුතුයි. ආගමික නායකයින් යේසුස් වහන්සේව අල්ලා ගැනීමට අවස්ථාව සොයමින් සිටියෝය. යේසුස් වහන්සේ යෙරුසලමට පැමිණෙමින් සිටි නිසා ඔවුන්ට එය පහසු විය. රෝමවරුන් වෙතට භාරදී උන්වහන්සේව මරා දැමීමට සැලසුම් කිරීමට ඔවුන් තීන්දුවක් ගත්තෝය.


මේ අතරතුරයේ බෙතනිවල උත්සවයක් පවත්වන ලදී.
මරියා
ඉතා වටිනා සුවඳ තෙල් නාස්ති කරන්න එපා වටිනවා නේද ?
අපිට එය විකුණා විශාල මුදලක් ලබා ගෙන, දුප්පත් අයට ඒ මුදල බෙදා දෙන්න තිබුණා
යුදස්, ඇයට ඉඩහරින්න. ඇ මේ තෙල්වලින් මා ආලේප කළේ මගේ තැන්පත් කිරීම උදෙසා


පාස්කු මංගල්‍යය උදාවිය. විශාල සෙනඟක් යෙරුසලමට පැමිණියෝය. දේව මාළිගාවේ පූජාවන් පැවැත්වීම සඳහා පූජාවන් ද රැගෙන පැමිණියෝය.


යේසුස් වහන්සේ විරුද්ධත්වය නොසලකා ඇතුල් වූ සේක.


මිනිසුන් උන්වහන්සේට ප්‍රශංසා කළෝය.
හුරේ
හෝසන්නා
දෙවියන් වහන්සේගේ නාමයෙන් එන්නා වූ තැනැන්වහන්සේට දීර්ඝායුෂ වේවා !
ඉශ්‍රායෙල්හි රජ්ජුරුවන් වහන්සේ
යෙරුසලම, සමාදානය ලබන ආකාරය ඔබ දැන සිටියා නම්, නමුත් ඔබට අවශ්‍ය නැත.
අන්න, මුළු ලෝකයාම ඔහු පසුපස යනවා.
ඔහු මෙය නතර කළ යුතුයි.


ප්‍රධාන නගරයේ වූ දේව මාළිගාව යුදෙව් ආගමේ කේන්ද්‍රස්ථානයයි.
පාස්කු සමයේ දී, බැටළුවන් ඝාතනය කරයි.
මිනිසුන්ගේ පාපය උදෙසා මිදීමේ මිලයක් ලෙස බැටළුවන් පූජා කරයි.
නමුත් බැටළුවන් පූජා කිරීමෙන් මිනිසුන්ගේ වැරදි, ලැජ්ජාව, වැනි හැඟීම් වලින් සැබවින්ම නිදහස් විය හැකිද ?
දේව මාළිගාවේ පිටත මළුවෙහි මිනිසුන් ඉතා ක්‍රියාශීලීව මුදල් මාරු කරමින් වෙළඳාම් කරමින් සිටියෝය.
හදිසියේ යේසුස් වහන්සේ එහි පැමිණි සේක.


දෙවියන් වහන්සේගේ ගෘහය, යාච්ඤාවේ ගෘහයක් විය යුතුයි. නමුත් නුඹලා එය සොරුන්ගේ ගුහාවක් කරලා.
ඔහු ඉතා භයානකයි. මිනිස්සු, ඔහුගේ හැම වචනයක්ම අල්ලා ගන්නවා.
ඔහු ඉවත් කිරීම සඳහා සුදුසු අවස්ථාවක් අප සොයාගත යුතුයි.


ඔහුව අල්ලා ගැනීමට අවස්ථාවක් අපි සොයා ගත යුතුයි. එවිට ඔහුව මරා දැමීමට අපට හැකිවේවි.
නමුත්, පාස්කු මංගල්‍යය උත්සව අවස්ථාවේ නොවේ.
ඔහු සඳහා ඔබ මට කීයක් දෙනවාද ?
ඒ යුදස්, ඔහුගේ ගෝලයන් ගෙන් එක්කෙනෙක්
මම, යේසුස් වහන්සේ ඔබට අල්ලා දෙන්නම්.
ඔහුට අල්ලා දෙනවාට රිදී කාසි තිහක් අපි ඔබට ලබා දෙනවා.


පාස්කු දිනයට පෙර දිනයේ
යේසුස් වහන්සේ, දේව මාලිගාවේ
රැස්ව සිටි මිනිසුන්ට
කථා කළ සේක. යෙරුසලම
අනාගතයේදී විනාශවන බවත්
සෑම කෙනෙකුටම පළා යන්න.
සිදුවන බවත් ප්‍රකාශ කළ සේක.
උන්වහන්සේ,
මිනිසුන්ට ප්‍රේම කළ සේක.
උන්වහන්සේ පේත්‍රුස්ට හා
යොහන්ට කෑම මේසය
පිළියෙල කිරීමට අණ කළ
සේක.
සවස් කාලයේදී, යේසුස් වහන්සේ සහ ගෝලයින් දොළොස් දෙනා
නගරයේදී මුණ ගැසුණි.
රාත්‍රියේදී මම එය
කරනවා


වධ විඳීමට ප්‍රථමයෙන් මේ පාස්කුව, නුඹලා සමඟ කෑමට මම ආශාවෙන් බලා සිටියා.
නායකයින් , අනික් මිනිසුන් තමන්ට සේවය කරනවාට කැමතියි. නමුත් , එයට වඩා වෙනස් වූ අය ලෙස ඔබ කටයුතු කල යුතුයි.
යමෙක්, ස්වාමියා වීමට කැමති නම් ඔහු ඔබලාගේ දාසයා විය යුතුයි.
මම, නුඹලා, අතරේ සේවකයෙක් වෙමි.


ස්වාමීනි, ඔබ මගේ පාද සෝදන්න යනවාද ? වහලෙක් වගේ ? නෑ කවදාවත් දෙන්නෑ.
පේත්‍රුස් මට ඔබේ පාද සෝදන්න නුදුන්නොත් මා සමඟ පාංගුකාරකමක් ඔබට නැහැ
ස්වාමීනි, මගේ හිසත්, පාදත් සෝදන්න.
යමෙක් නෑවාම පවිත්‍ර බැවින් ඔහුට අවශ්‍ය වන්නේ පාද සේදීම පමණයි.
ඔබ මට ආචාරිණී, ස්වාමිනි, කියා කියනවා එය හරි, මමම එසේ වෙමි. මම ඔබේ පාද සේදුවා නම්, ඔබලා විසින් ද එකිනෙකාගේ පාද සේදිය යුතුයි.
ඔබ අතරින් එක් කෙනෙක් මා පාවා දෙනවා
ඒ මා නොවෙයි නේද ?
කවදාවත් නෑ
යුදස්, ඔබට අවශ්‍ය කුමක් ද? එය ඉක්මනින් කරන්න.


මා සිහිකිරීම පිණිස මෙය කරන්න.
මේ රොටී කන්න. එය මාගේ ශරීරයයි.
මේ මිදියුෂ පානය කරන්න. මේ, ඔබලා උදෙසා වගුරුවන මාගේ ලෙයයි. දෙවියන් වහන්සේ ඔබලා සමඟ පිහිටුවන අළුත් ගිවිසුමයි.
මම ඔබලාට ප්‍රේමකලාක් මෙන් ඔබලාත් එකිනෙකාට ප්‍රේම කරන ලෙස අලුත් ආඥාවක් දෙමි.
මගේ ප්‍රේමය ඔබලා තුළ තිබෙනවා නම් ඔබලා මාගේ ගෝලයෝ බව එයින් සියල්ලන් දැන ගන්නවා ඇත.
ස්වාමීනි, මම ඔබ අනුව ඔබ යන සෑම තැනකට එමි. මගේ ජීවිතයද ඔබ උදෙසා දෙමි.
පේත්‍රුස්, කුකුලා හඬලන්නට පෙර ඔබ මා හඳුනන්නේ නැතැයි තුන්වරක් කියනවා ඇත.



පසුව ඒ සන්ධ්‍යා කාලයේදී, යේසුස් වහන්සේ උන්වහන්සේගේ ගෝලයන් සමඟ නගරය අතහැර ගිය සේක. ඔවුන් සමඟ යුදස් නොසිටියේය.
මම, ඔබලාගෙන් වෙන්වී යනවා. පියාණන් වහන්සේ නුඹලා වෙතට සැනසිලිකාරයාණන් වහන්සේ එවන සේක. උන්වහන්සේ ආ කළ ඔබලාට උපකාර කරයි. ඔබලා සමඟ නිතරම රැඳී සිටියි.
මම යන ස්ථානයකට, යන පාර ඔබලා දන්නවා.
මාර්ගයද, සැබෑවද, ජීවනයද මමය. මා කරන කොට ගෙන මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත.
ඔබලා මෙහි නතර වන්න, මම ටිකක් එහාට යනවා යාච්ඤා කරන්න.
මාගේ පියාණනි, ඔබ කැමති සේක්නම් මේ කුසලාන මාගෙන් පහ කරන්න.
එසේ වී නමුත් මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා.




ඔබලා නිදා ඉන්නේ කොහොමද? නැගිට බලන්න. මා පාවා දෙන්න ළඟයි
මා සිඹ ගන්න. තැනැත්තා අල්ලා ගන්න.
ශුභ සිද්ධ වේවා ගුරුතුමෙනි,
යුදස්, ඔබ සිඹීමකින් මෙසියස් වහන්සේ පවා දෙනවා ද ?
ස්වාමිනි, අපි සටන් කරමුද ?
නවත්වන්න
යේසුස් වහන්සේ, ඔවුන්ට උන්වහන්සේව අල්ලා ගෙන යන්න ඉඩ හැරිය විට, අනුග්‍රාමිකයන් සී සී කඩ පලා ගියෝය.


යේසුස් වහන්සේව, උත්තම පූජකයා, එනම් යුදෙව් පූජකයන්ගේ නායකයා වෙත රැගෙන යනවිට, තරමක් දුරින් පසු පසින් පේත්‍රුස් සහ යොහාන් ද ගියෝය.
පේත්‍රුස් පිටත මළුවෙහි සෙනඟ අතර සැඟවී සිටියේය.
ඔබ, ඔහු සමඟ සිටියා නේද ?
නැහැ, මම ඔහුව කොහෙත්ම දන්නේ නෑ
ඔබ ඔවුන්ගෙන් කෙනෙක් නේද ?
මට හොඳටම විශ්වාසයි. ඔබ ඔවුන්ගෙන් කෙනෙක් ඔබ ගලීලයේ වැසියෙක්
ඔබ කියන දේවල් ගැන මම දන්නේ නෑ.


කු..... ක් කු...... කු
........ කු ..................
යේසුස් වහන්සේ පේත්‍රුස් දෙස බැලූ සේක
ඔබට ගැහුවේ කවුද කියලා දිවැසින් කියන්න.
යේසුස් වහන්සේව උදෑසනින්ම යුදෙව් නායකයින් ඉදිරියට රැගෙන ආවෝය.
ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා ද ?
ඔබ එසේ කියනු ලැබුවා.
ද්‍රෝහියා ඔහු මරණයට සුදුසුයි. රෝමවරුන්ට අවස්ථාවක් දෙමු.



පිලාත් නම් රෝම ආණ්ඩුකාරයා ඉදිරියට යේසුස් වහන්සේ ගෙන ආ සේක. යුදෙව් නායකයින් බලා සිටි අය කලඹමින් කෑගසන්නට පටන් ගත්තෝය.
ඔබට විරුද්ධව නගන චෝදනාවලට කිසිවක් නොකියන්නේ ඇයි.
මොනවාද ඔබ කළේ ?
මම ආවේ සත්‍යයට සාක්ෂි දෙන පිණිස
සත්‍යය නම් කිමෙක්ද ?
ඔහු අත කිසිවරදක් මට නොපෙනෙයි. නමුත් පාස්කු මංගල්‍යය කාලයේදී එක් වරද කාරයෙක් නිදහස් කරන සිරිතක් ඔබලාට ඇත. මා නිදහස් කළ යුත්තේ කවුද ? බරබ්බස් ද යුදෙව්වරුන්ගේ රජුද ?


බ ර බ් බ ස් !
බරබ්බස්ව නිදහස් කරන්න.
මේ යේසුස් ගැන මා කුමක් කරන්නද ?
ඔහු කුරුසපත් කරන්න
ඔහු රජෙකු ලෙස පෙනී සිටිනවා
ඔබ ඔහුව නිදහස් කළහොත් ඔබ සීසර්ගේ මිතුරෙකු නොවේ
ඔහු වෙනුවට ඔබට නිදහස් වී යා යැකියි.
යේසුස් වහන්සේ වෙනුවට බරබ්බස්ව නිදහස් කරන ලදී. ඔහුගේ හදවතේ මිනිමැරීමේ වරදකාරී හැඟීම විය.
... 37, 38, 39!
ඔහුගේ ලේවලට මම නිදොස් වෙමි.
යුදෙව්වන්ගේ රජතුමනි, සැරදේවා


මොහු දෙස බලන්න
කුරුසියේ ඔහුව මරාදමන්න.
ඔහු සමඟ ඉවත්වෙන්න
කුරුසියේ ඔහුව මරා දමන්න.
පිලාත්, යේසුස් වහන්සේ කුරුසපත් කිරීමේ ලියවිල්ලට අත්සන් කළේය. යෙරුසමේ, වීදියේ, යේසුස් වහන්සේට කුරුසිය උසුලාගෙන යාමට සිදු වූ සේක.
නගරයෙන් පිටත, කුරුසියේ ඇණ ගසන ස්ථානය විය. ඔව්හු, ඉස්කබල ස්ථානය යන අර්ථය ඇති ගොල්ගොතා නම් ස්ථානයට පැමිණ ..............
මෙහිදී, සොල්දාදුවන් විසින් යේසුස් වහන්සේව කුරුසියේ ඇණ ගැසුවෝය.



ඒ අතරතුර, යුදස් ඔහු කළ දේ ගැන කනස්සලු වී,
මම කළ දේ වැරදියි
ඒ අතරතුර, යුදස් ඔහු කළ දේ ගැන කනස්සලු වී,
ඒකට අපිට කරන්න දෙයක් නෑ. ඔබම එය බලා ගන්න
සොරුන් දෙදෙනෙක් මැද යේසුස් වහන්සේව කුරුස පත් කළෝය.
පියාණනි, ඔවුන්ට කමා කරන්න. ඔවුන් කරන්නේ මොනවාද කියා ඔවුන් නොදනී.



“යේසුස් වහන්සේ යුදෙව්වරුන්ගේ රජු” ලෙස භාෂා තුනකින් සටහන් කළ පුවරුවක්, උන්වහන්සේ ඇණ ගැසූ කුරුසියේ සවි කරණු ලැබීය.
IESVS NAZARENVS REX IVDAEORVM
බිමට ලබා දුන් තිත්ත කාඩිය යේසුස් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කළ සේක.
උන්වහන්සේගේ වස්ත්‍ර උදෙසා සොල්දාදුවන් පස ඇට දමන ලදී.
ඔව්, ඔහු අනිත් අය ගලවා ගන්නේ නැද්ද ?
ඔබ, දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් කුරුසියෙන් බහින්න.
ඔබත්, අපත් ගලවා ගන්න.
ඔබ, දෙවියන්වහන්සේට ගරු කරන්න. අප කළ වැරදි වලට දඬුවම් අප ලැබුවා. නමුත් උන්වහන්සේ කිසි වරදක් නොකළ සේක.
ඔබගේ රාජ්‍යයට ඇතුල්වන කළ මා සිහි කරන්න.
අදම ඔබ මා සමඟ පාරාදීසියට ඇතුළු වන බව සහතිකව කියමි.


මධ්‍යාහ්න වෙලාවේදී දේශය මුළුල්ලෙහිම, පැය තුනක් තිස්සේ, අන්ධකාරය විය.
යේසුස් වහන්සේගේ මව වු මරියා සහ යොහාන්, උන්වහන්සේගේ ගෝලයින් බලා සිටියෝ ය.
දැන්, ඔබ, ඔහුගේ මෑණියන්. ඔබ, ඇයගේ පුතා.
මාගේ දෙවියනි, මාගේ දෙවියනි, ඔබ මා අත්හැරියේ මක්නිසාද ?
මට පිපාසයි.
පියාණෙනි, ඔබගේ අතට මාගේ ආත්මය භාර දෙමි.
එය තීන්දු වුනා



දහවල් තුනට, යේසුස් වහන්සේ මියගිය සේක. එක් සෙබළෙක් උන්වහන්සේගේ ළයට ඇන්නේය. එකෙනෙහිම වතුරත්, ලෙයත් නික්මුණේය. ඔහුගේ හදවත සිදුරු වුණේය.
උන්වහන්සේ මරන්නට ගෙන යන බැටළු පැටවෙකු මෙන් වූ බව පොත්වල සඳහන් වෙයි.
ඔහු දුක්වින්දේ අපේ වරදවල් නිසයි. මැරුණේ අපේ පාප නිසයි.
උන්වහන්සේ පැමිණෙන්න හිටිය මෙසියස් වහන්සේද? නැද්ද ?
එන්න, උන්වහන්සේම තැන්පත් කරන්න, අපි ඉල්ලා සිටිමු.
අරිමාතියේ යොසෙප් හා නිකදේමුස් විසින් යේසුස් වහන්සේගේ ශරීරය කුරුසියෙන් පහතට ගෙන, සිහින් හණ රෙද්දකින් වෙළා, ඒ දක්වා කිසිවෙකු නොතැබුවා වූ ගලක කපන ලද සොහොන් ගෙයක තැම්පත් කරන ලදි.


පාස්කු විවේකී දවසෙන් පසුව සමහර කාන්තාවන් සොහොන වෙතට ගියෝය
ගල අහකට පෙරළලා
ජීවත්ව සිටින තැනැත්තා මළවුන් අතරේ නුඹලා සොයන්නේ ඇයි ? උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටුණ සේක. ගොස් උන්වහන්සේගේ ගෝලයන්ට ප්‍රකාශ කරන්න.
ඔවුන් මෙය ඇසූ විට, පේත්‍රුස් සහ යොහාන් සොහොන් ගෙය දෙසට දිව ගියෝය.
මොකක්ද වුනේ ?
එය සම්පූර්ණයෙන්ම හිස්



පිටත, එළිමහනේ,
ස්ත්‍රිය, ඔබ අඬන්නේ, මක්නිසාද ? ඔබ සොයන්නේ කාවද ?
උයන් පාලකතුමනි, උන්වහන්සේගේ ශරීරය පිටතට ගෙන ගියා ද ?
මරියා
ස්වාමීනි
මට අත නොගසන්න. මාගේ සහෝදරයන් ළඟට ගොස්, මම මාගේ පියාණන් වහන්සේ හා නුඹලාගේ පියාණන් වහන්සේ ද මගේ දෙවියන් වහන්සේ හා නුඹලාගේ දෙවියන් වහන්සේ ද වෙතට යන බව කියන්න.



ඒ දවසේදී, කනස්සල්ලට පත්වූ යේසුස් වහන්සේගේ ගෝලයන් දෙදෙනෙක්, යේසුස්වහන්සේට මරණ දණ්ඩනය නියම කිරීම ගැන මග ගමන් කරමින් සාකච්ඡා කළෝය.
ඔබ අනාගතවක්තෘ විශ්වාස කරන්නේ නැද්ද? මෙසියස් වහන්සේ ඒ දේ විඳලාම ස්වකීය මහිමයට පැමිණෙන්නට තිබුණා නොවේද ? උන්වහන්සේ පිළිබඳ සියලම ලියැවිලිවල ලියා තිබුණා නොවේද?
ඔවුන් දෙදෙනා සමග සිටි අමුත්තා රොටි රැගෙන කඩා ආශිර්වාද කර දුන්නාත් සමග අතුරුදහන් විය.
ඒ මොහොතේදීම ඔවුන් යෙරුසලමේ සිටි තම මිතුරන් වෙතට හැරී ගියෝය.
අපි ස්වාමින් වහන්සේව දැක්කා.
මරියා සහ පේත්‍රුස් ද දැක්කා
ඔවුන් කථා කරමින් සිටින අතර, හදිසියේම,
ඔබලාට සමාදානය වේවා.
ඔබලා, මා විශ්වාස කරන්නේ නැද්ද ? මගේ අත් හා පාද බලන්න.
මාගේ ස්වාමීනි, මාගේ දෙවියනි,



දින හතලිහක් තිස්සේ යේසුස් වහන්සේ, උන්වහන්සේගේ අනුගාමිකයන්ට ප්‍රකාශ වූ සේක, උන්වහන්සේ එක්වර පන්සියකට මුණ ගැසුණු සේක. උන් වහන්සේගේ අනුගාමිකයන් ගලීලයට හැරී ගියෝය. එක් දිනක ඔවුන් මසුන් අල්ලමින් සිටියදී,
දරුවෙනි, ඔබලා ළඟ කන්න යමක් නැද්ද ?
නැහැ, අපිට මසුන් අහුවුනේ නැහැ
ඔරුවේ අනික් පැත්තට දැල දමන්න.
හරිම පුදුමයි. දැල ඉරෙන තරමට මාළු
ඒ... ස්වාමීන් වහන්සේ
ස්වාමීනි
එන්න, මා සමඟ කෑම කන්න.


පේත්‍රුස්, ඔබ මට සැබවින්ම ප්‍රේම කරනවාද ?
යේසුස් වහන්සේ මේ ප්‍රශ්නය තුන්වතාවක්ම ඇසූ සේක.
ඔව් ස්වාමීනි, මම ඔබට ප්‍රේම කරන බව ඔබ දන්නවා.
මාගේ බැටළුවන් බලාගන්න
මාව අනුගමනය කරන්න.
ස්වර්ගයේ ද පොළවේද සියළු බලය මට දී තිබේ. ඔබලා ගොස් සියළු ජාතීන් ගෝලයන් කරපල්ලා. පියාණන්ගේත්, පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට බෞතිස්ම කරන්න. මා විසින් ඔබලාට ඉගැන්වූ සියල්ලම පවත්වන්නට ඔවුන්ට උගන්වන්න.
මතක තියාගන්න, මමද ලෝකාන්තිමය දක්වා සැමදාම නුඹලා සමඟ සිටිමි.
මෙසේ ස්වාමීන්වහන්සේ ඔවුන්ට කථා කළ පසු ස්වර්ගයට ඔසවා ගනු ලැබූ සේක. නමුත් උන්වහන්සේ නැවත එන බව ප්‍රකාශ කළ සේක.


දින පනහා, එනම් පෙන්තකොස්ත දින දක්වා ඔවුන් සියල්ලෝම එක්රැස්ව යාඥා කළෝය. පෙන්තකොස්ත දිනයේදී ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන් කෙරෙහි පැමිණි සේක. අනුගාමිකයන් හා යේසුස්වහන්සේ විශ්වාස කළ සියල්ලෝම කෙරෙහි යේසුස් වහන්සේ තුළ තිබුණාවූ ආත්මයෙන් පූර්ණවිය. උන්වහන්සේ ගේ ගෝලයන් බලයෙන් පූර්ණ වූ සාක්ෂිකරුවන් විය. බොහෝ සෙනඟක් යේසුස්වහන්සේ ගැන ඇසුවෝය.








දැන් ලෝකයේ බොහෝ ප්‍රදේශවල සෙනඟ එකට එකතු වී යාච්ඤා කරමින් බයිබලය කියවති. දෙවියන් වහන්සේගේ කරුණාවෙන් ඔවුන් ජීවත්වෙති. යේසුස් වහන්සේගේ ප්‍රේමය ඔවුන් අත්දකිති. ඔවුහු එකිනෙකාට ප්‍රේම කරමින්, එකිනෙකාගේ අවශ්‍යතාවලදී උදව් කරගනිති. ඔවුන්ගේ සතුරන්ටද ප්‍රේම කරති. රොටී කඩමින්, මිදි යුෂ පානය කරමින්, ඔවුන්ගේ වරද කමා කළ බව සිහි කරති. ඔවුන් දෙවියන් වහන්සේගේ ආත්මයෙන් හා බලයෙන් ජීවත් වෙති.


යේසුස් වහන්සේ, මනුෂ්‍යයාට, සමාදානයෙන් හා එක්ව ජීවත්වීමේ හැකියාව ලබා දුන් සේක.
දෙවියන් වහන්සේගේ ප්‍රේමයට ගරු කරන්න. උන්වහන්සේගෙන් ලබාගන්න. උන්වහන්සේව නමස්කාර කරන්න.
දෙවියන් වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයා මේ ලෝකයට එවනු ලැබුවේ, අප විනිශ්චය කරන්නට නොවේ. නමුත් අපව ගලවනු ලබන පිණිසයි. මක්නිසාද දෙවියන් වහන්සේ අපට කොතරම් ප්‍රේමකලාද යත් ඒක ජාතක පුත්‍රයා දෙන තරමට ප්‍රේම කළ සේක. උන්වහන්සේව විශ්වාස කරන කවරෙක් නමුත් ජීවත් වන්නේය. ඔවුන්ට සදාකල ජීවනය ඇත.
WILLEM DE VINK

# යේසුස් වහන්සේ හා ඔබ



යේසුස් වහන්සේගේ ජීවිත කථාව නිමයි. යේසුස් වහන්සේ, බොහෝ දෙනෙකුගේ ඉතා උත්තරීතර මිතුරා වූ සේක. එදා සහ අද ලෝකය වෙනස් වී ඇත. අද මිනිසුන් ගමන් කරන්නේ බූරුවන් පිට හෝ අශ්වයින් පිට නොවේ. මෝටර් රථයකින් හෝ ගුවන් යානයකිනි නමුත් මේ සියල්ල යේසුස් වහන්සේට වෙනසක් නොවේ. එදා යේසුස් වහන්සේ ඉශ්‍රායෙල් රටේ සිටියාක් මෙන්ම අද ද අප ලඟින්ම සිටින සේක.

උන්වහන්සේ අදෘශ්‍යමානයි. නමුත් උන්වහන්සේ සත්‍යයයි. ඔබ උන්වහන්සේට ඇහුම්කන් දෙන්න. එවිට ඔබ උන්වහන්සේට ප්‍රේම කරයි.

යේසුස් වහන්සේ ගැන තවත් දැන ගැනීමට හා ලංව ජීවත්වීමට ඔබට අවශ්‍යද ? පහත
සඳහන් කරුණු අනුගමනය කරන්න.

**1. ඔබ විසින්ම බයිබලය කියවන්න ආරම්භ කරන්න.**
(උදාහරණයක් ලෙස ලූක්තුමා විසින් රචිත ලූක් ශුභාරංචි පොතෙන් අරඹන්න)

**2. යාච්ඤා කරන්න පටන් ගන්න.**
(දෙවියන් වහන්සේ සමඟ කථා කරන්න සහ ඇහුම්කන් දෙන්න. ඔබ විශේෂ වචන භාවිතා කරන්න අනවශ්‍යයයි.)

**3. යේසුස් වහන්සේ සහ බයිබලය ගැන අන්‍යයන්ට කියන්න.**
උන්වහන්සේගේ අනුගාමිකයින් එකිනෙකා හමුවීම ධෛර්යමත් කරගැනීම හා උන්වහන්සේ ගැන ඉගෙන ගැනීම උන්වහන්සේගේ කැමැත්තයි.

## යාච්ඤාව

දෙවියන් වහන්සේ සමඟ මිතුරු වීමට හා ඔබ කළ වැරදි ගැන පසුතැවිලිවීමට පහත සඳහන් ආකාරයට ඔබ යාච්ඤා කරන්න.

ප්‍රේමණීය දෙවිදුනි, ඔබ මට ආදරෙයි. ඔබගේ ඒක ජාතක පුත්‍රයා වන යේසුස් වහන්සේ අපට ලබා දුන්නා. මා කළ සියළුම වරදවලට කරුණාකර මට කමා කරන්න.

සමාවන්න.

ඔබට ස්තූතියි. දැන් යේසුස් වහන්සේ මා සමඟයි. මාගේ අයිතිය ඔබට පවරමි. ඔබට අවශ්‍ය ලෙස ජීවත්වන්න මට උපකාර කරනවා නේද? මා සමඟ නිතර සිටිනවා නේද? මට පිළිතුරු දීම ගැන ඔබට ස්තූතියි. ඔබ පොරොන්දු වූ ආකාරයට මා සමඟ සිටින්න.

Sinhala book translated & published by Living Water Christian Church with Love Care Project

Jesus Messiah - The man who changes the world
Text and illustrations: Willem de Vink

Copyright © 1993 Stichting Wereldtaal,
Houten, The Netherlands.
Published in Dutch as “Jezus Messias”.
Edition in Sinhala (Sri Lanka) © 2022
Digital copyright under the terms of the
Creative Commons BY-SA license.
All rights of translation, reproduction and adaptation
reserved for all countries.

e-mail: jmpbk.app@gmail.com
https://www.jesusmessiahcomicmedia.com
https://jesusmessiahcomicmedia.com/srilanka
More information about the project: willemdevink.nl

Printed books available in the Netherlands:
Albanian, Arabic, Chinese, Dutch, English, Hebrew, Kurdish (Kurmanji), Papiamento, Polish, Portuguese, Romanian, Spanish, Tigrinya, Turkish.

මෙවැනි මනරම් කථාවක් තවත් නොමැත. යේසුස් වහන්සේගේ ජීවිත කථාව ඉතා විචිත්‍රව මෙම පොතෙහි ලියැවී ඇත. කාලයකට සීමා නොවූ, සෑම යුගයකටම ලියැවී ඇත. කාලයකට සීමා නොවූ, සෑම යුගයකටම ගැලපෙන මෙම කථාව ලෝකයේ බොහෝ දෙනෙක් විසින් කියවනු ලබති. මෙම ඉතා විචිත්‍රවත් පොත, භාෂා 200 කට පරිවර්ථනය කර ඇති අතර, මිලියන දෙකක පිටපත් මුද්‍රණය කර ඇත.

එය දැන් සිංහලෙන් හා ද්‍රවිඩ භාෂාවෙන්ද ඇත. බයිබලයේ සඳහන්ව ඇති යේසුස් වහන්සේගේ ජීවිත කථාව, සෑම කාලයකටම ගැලපෙන ඉතා මනරම් කථා පුවතකි. එය එතරම් විශේෂ වන්නේ ඇයි ? "ඔබගේ සතුරන්ට ප්‍රේම කරන්න." යේසුස් වහන්සේ ප්‍රකාශ කළ සේක. උන්වහන්සේ තම ජීවිතයෙන් එය මනා ලෙස ඔප්පු කළ සේක. උන්වහන්සේ ඉතා අහිංසකයි. උන්වහන්සේ කුරුසියේදී අපගේ දඬුවම වින්ද සේක. එසේම උන්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටුණාසේක. උන්වහන්සේ විශ්වාස කරණ සියලු දෙනාටම එම බලය ලබා දෙන බවට උන්වහන්සේ පොරොන්දු වූ සේක. ඒ බලවත් ප්‍රේමය, මරණයෙන් පවා ජය ලබා දෙයි.



SINHALESE

සිංහල

THE GRACE FACTORY

ISBN 978-94-93178-94-6

9 789493 178946